EQUAL GROUND

# ප්‍රහේලිකාවේ අත්හැරුණු කොටසක්: ශ්‍රී ලංකාවේ අධ්‍යාපන හා සේවා නියුක්ති ප්‍රතිපත්ති පිළිබඳ LGBTIQ ප්‍රවේශයකින් සිදු කෙරෙන විශ්ලේෂණය

© EQUAL GROUND 2022

සම්පාදනය : සාරා අර්සූමන් චෞද්‍රි

*වගකීමෙන් නිදහස් වීම: රාජ්‍ය හා ජාතික මට්ටම්වලට අදාළ වන ප්‍රතිපත්ති හා නීති ආදිය සියල්ලම ආවරණය කිරීමේ වගකීම EQUAL GROUND විසින් දරනු නොලබයි. මෙම ප්‍රකාශනයෙහිදී EQUAL GROUND ප්‍රයත්න දරනුයේ ලබා ගත හැකි වූ සහ ප්‍රවේශ විය හැකි වූ ලේඛන සමාලෝචනය කිරීමටය.*

## මූලික කරුණු දැක්වීම

සමරිසි කාන්තා හා පිරිමි, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අන්තර්ලිංගික සහ ප්‍රශ්නභාවී/ක්වියර (මින් ඉදිරියට LGBTIQ) ප්‍රජාවද ඇතුළත්ව සියලුම දෙනා වෙනුවෙන් සමාජ අන්තර්ග්‍රාහීභාවය සහතික කිරීම හුදෙක් මානව හිමිකම් පිළිබඳ කරුණක් පමණක් නොව යම් රටක ආර්ථික සංවර්ධනය විෂයික කාරණාවක්ද වේ.

LGBTIQ ජනතාව වෙනස් කොට සැලකීම සහ අවමානයට ලක් කිරීම හේතුවෙන් ඔවුන් බැහැර කිරීමකටද ලක් වන අතරම රටක සමස්ථ ආර්ථික ක්‍රියාදාමයේ ඵලදායීතාව අඩු කිරීමට හේතු වන පරිදි මානව ප්‍රාග්ධනය අපතේ යැවීමක් ලෙසද එය හැඳින්විය හැකිය. එමතුද නොව, ශ්‍රී ලංකා රජය විසින් 2023 වන විට සාක්ෂාත් කර ගැනීමට අරමුණු කරන තිරසාර සංවර්ධන ඉලක්ක වෙත බාධාවක්ද එමගින් එල්ල වේ. ''මිනිසුන් බැහැර කිරීමේ පිරිවැය අධික වන බැවින් සමාජ අන්තර්ග්‍රාහීත්වය වැදගත් වන්නේය'' යන්න මෑතකාලීනව ලෝක බැංකුව විසින් පළ කරන ලද වාර්තාවක සඳහන් අදහසකි.

වැඩිහිටියන් දෙදෙනෙකුගේ කැමැත්ත මත සිදු වන සමරිසි ලිංගික ක්‍රියා සාපරාධී ක්‍රියා ලෙස සලකනු ලබන, වෙන් කොට සැලකීමට තුඩු දෙන නීති වෙනස් කරන ලෙස විවිධ ජාත්‍යන්තර ආයතන හා සංවාද මණ්ඩල විසින් ශ්‍රී ලංකා රජය වෙත දිගින් දිගටම ඉල්ලීම් කර ඇති නමුදු මෙරට රජය LGBTIQ ප්‍රජාවගේ හිමිකම් නොසලකා හැරීමකට හෝ ඔවුන් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ආරක්ෂා කෙරෙන බවක් උලුප්පා දැමීමට හෝ පියවර ගෙන තිබේ. මෙම ප්‍රතිපත්ති සමාලෝචනයෙහිදී EQUAL GROUND හි අරමුණ වන්නේ රජය විසින් දරනු ලබන ස්ථාවරයෙහි පිළිගත හැකි බවක් තිබේද යන්න හඳුනාගනු පිණිස අධ්‍යාපනය හා රැකියා නියුක්තිය යන කාරණාවලට අදාළ රජයේ නීති හා ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම වේ.

ඕනෑම රටක ආර්ථික සංවර්ධනය පිළිබඳව සලකා බැලීමේදී අධ්‍යාපනය සහ සේවා නියුක්තිය වෙත හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. විවිධ අපකීර්තිකර සහ යල්පැන ගිය සමාජ ආකල්ප පාදක කර ගනිමින් LGBTIQ ජනතාව සමාජයෙන් බැහැර කිරීම නිසැක වශයෙන්ම රටක වියදම ඉහළ නංවන සාධකයකි. එහි ප්‍රතිඵලයක් ලෙස ඵලදායීතාව හා ප්‍රතිඵලදායීතාව පහත වැටීම ඊට හේතුවයි. මේ නිසා, පවතින නීති සහ ප්‍රතිපත්ති - විශේෂයෙන්ම අධ්‍යාපනය සහ සේවා නියුක්තියට අදාළ ඒවා - සියුම් ලෙස පිරික්සා බලමින් එවැනි බැහැර කිරීමක තරම තක්සේරු කිරීම මගින් මෙම ගැටළුව විසඳා ගැනීමට සුවිශාල පිටුබලයක් ලැබෙනු ඇත.

## අධ්‍යාපනය

පොදු මානව ප්‍රාග්ධනය ග්‍රහණය කර ගැනීමට තරුණ ප්‍රජාව වෙත සහාය වන මූලික පසුබිම වන්නේ අධ්‍යාපනය වන අතර ඉහළ ඵලදායීතාවක් හා ආර්ථික වර්ධනයක් අත්කර ගැනීමට මුල් වන නිපුණතා, හැකියාවන්, දැනුම සහ යහපත් සෞඛ්‍යය යනාදිය ඊට ඇතුළත් වෙයි. කෙසේ වෙතත්, සමාජයෙන් බැහැර කිරීම සහ අපකීර්තිකර ආකල්පවලින් වෙළනු ලැබීම හේතුවෙන් එවැනි මානව ප්‍රාග්ධනයක් අත්කර ගැනීමට ඇති අවස්ථා අහිමි කෙරෙන අතරම අනාගත ආර්ථික ප්‍රතිඵල අවම වීමටද එය හේතු වෙයි.

EQUAL GROUND විසින් සිදු කරන ලද එක්තරා අධ්‍යයනයකදී ප්‍රතිචාර දැක්වූ LGBTIQ පුද්ගලයන් සියලුම දෙනා අතරින් විශ්වවිද්‍යාල මට්ටමේ අධ්‍යාපනයක් ලැබ තිබුණේ 29% ක් පමණක් බව හෙළි විය. උපාධිධාරීන් පවා රැකියාවක් ලබා ගැනීමට දැඩි ප්‍රයත්න දරන පසුබිමක රැකියා වෙළෙඳපොල ඉතාම තරගකාරී ස්වභාවයක් උසුලන හෙයින් මෙය කණගාටුදායක තත්ත්වයක් බව කිව යුතුය. EQUAL GROUND විසින් තවත් එවැනිම අධ්‍යයනයක් (2021) මෑතකාලීනව සිදු කරන ලද අතර එහිදී LGBTIQ ප්‍රතිචාර දැක්වූවන් අධ්‍යාපන ආයතන විස්තර කළේ ඉගෙනුම් හිතකර පරිසරයක් වෙනුවට පීඩනාත්මක පරිසරයක් පවතින ස්ථාන ලෙස ය. තවත් අධ්‍යයනයකදී (2021) අනෙකුත් ශිෂ්‍යයන් අතින් LGBTIQ පුද්ගලයන් අවමානයට ලක් වීමට බලපෑ ප්‍රධාන සාධක ලෙස ශාරීරික පෙනුම, අපකීර්තිය සහ වෙනස් අයවළුන් වීම (මානසික/ශාරීරික වශයෙන්) යනාදිය හඳුනා ගැණින. ලිංගික දිශානතිය සහ/හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාව හෝ ප්‍රකාශනයට අදාළ වෙනස්කම් ඇතැම් LGBTIQ පුද්ගලයන් මුල් වරට හඳුනාගනු ලැබ ඇත්තේ පාසල් සමයේදී බවද එම අධ්‍යයනයේදී හෙළිදරවු වීම සැලකිය යුතු කරුණකි. එම ඉතා තීරණාත්මක අවධියේදී ''අන්‍යකරණයට'' ලක් කිරීම හෝ බැහැර කිරීම මෙන්ම උපහාසයට ලක් කිරීම මගින් කෙනෙකුගේ මානසික සෞඛ්‍යය, සමාජ නිපුණතා සහ පුද්ගල සංවර්ධනය කෙරෙහි දැඩි බලපෑමක් එල්ල කෙරෙයි. පර්යේෂණවලට අනුව, LGBTIQ සාමාජිකයන් ස්වකීය පාසල් කාලයේදී පීඩනයට ලක් වීම, හුදකලා වීම අත්විඳ ඇති බවක් හෙළි විය. පාසල යනු සිසුන්ගේ වර්ධනය හා සංවර්ධනය වෙත සහයෝගී අධ්‍යයන පරිසරයක් විය යුතු බව පිළිගැනෙන නිසා මෙය සලකා බැලිය යුතු ගැටළුකාරී තත්ත්වයකි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සෑම අයෙකුටම අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය සහතික කෙරෙන නමුදු විස්තීර්ණ ලිංගිකත්ව අධ්‍යාපනය, ලිංගික දිශානතිය සහ/හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාව/ප්‍රකාශනය, අවමානයට ලක් කිරීම වැළැක්වීම සහ/හෝ ලිංගික දිශානතිය සහ/හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාව/ප්‍රකාශනයට අදාළ හිංසන සම්බන්ධ ප්‍රතිපත්ති ආදී කාරණා සලකා බැලීමේදී විවිධ සට්ටනකාරී ගැටළු තවමත් ඉතිරිව පවතී.

යුනිසෙෆ් සංවිධානය සහ නෙදර්ලන්ත රජය විසින් 2012-2016 කාලයේදී රටවල් 14 ක් පාදක කරගනිමින් **Peacebuilding, Education and Advocacy Programme (PBEA)** නමින් වැඩසටහනක් දියත් කරන ලදි. එම රටවල් නම් බුරුන්ඩි, චැඩ්, අයිවරි කෝස්ට්, කොංගෝ ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, ඉතියෝපියාව, මියන්මාරය, පකිස්තානය, සියෙරා ලියෝන්, සෝමාලියාව, දකුණු සුඩානය, පලස්තීනය, උගන්ඩාව සහ යේමනය යි. මෙම ප්‍රයත්නයෙහි එක් අරමුණක් වූයේ අධ්‍යාපන ආයතන ආශ්‍රිතව වෙනස්කම් සහ විවිධත්වය ඉවසීම ඉහළ නැංවීමයි. ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රාජ්‍යයක් වුවද එම ක්‍රියාදාමය හා එක් නොවීම විශේෂයකි.

2000 වසරේ අග භාගයේදී පමණ කැලණිය විශ්වවිද්‍යාලය විසින් ස්ත්‍රී/පුරුෂ සමාජභාව සමානාත්මතාව සම්බන්ධයෙන් ප්‍රතිපත්තියක් කෙටුම්පත් කළ අතර කොළඹ විශ්වවිද්‍යාලය විසින් 1990 ගණන්වලදී ලිංගික හිංසනයට එරෙහි ප්‍රතිපත්තියක් පිළියෙළ කරන ලදි. කෙසේ වෙතත්, එකී එකදු ප්‍රතිපත්තියක් හෝ මේ දක්වා ක්‍රියාත්මක කර නොමැත.

| දැනට පවතින ලේඛන/යාන්ත්‍රණ | සලකා බැලිය යුතු ක්ෂේත්‍ර |
|---|---|
| **ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් දැනට පවතින අධ්‍යාපන පද්ධතිය සමාලෝචනය කිරීම :**<br><br>එය මගින් එහි ප්‍රධාන වටිනාකම් ලෙස අන්තර්ග්‍රාහීභාවය, සමාන හා වෙනස් කොට නොසලකන අධ්‍යාපන පද්ධතියක් නිශ්චය කර ඇත.<br><br>සමස්ථ අධ්‍යාපන අංශය වෙනුවෙන් නිර්දේශ කිහිපයක්ද එම සමාලෝචනය මගින් යෝජනා කර ඇත. මානව කාය විච්ඡේදනය සහ ලිංගිකත්ව අධ්‍යාපනය ප්‍රධාන විෂයයන් ලෙස ඇතුළත් කිරීම එවන් පොදු මධ්‍ය කාලීන (2020-2023) නිර්දේශයක් විය. | කෙසේ වෙතත්, ආගම, කුලය, සමාජ පන්තිය, ජාතිකත්වය, වාර්ගිකත්වය, විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් ආදී සාධක පිළිබඳව එහි සඳහන් වෙතත් විවිධ ලිංගික දිශානතීන් සහ/හෝ ස්ත්‍රී/පුරුෂ සමාජභාව අනන්‍යතා පිළිබඳ සඳහනක් එහි ප්‍රදාන වටිනාකම් අතර ඇතුළත් නොවීම පුදුමයකි.<br><br>ඇමරිකානු ළමා රෝග ඇකඩමියට අනුව, ලිංගිකත්ව අධ්‍යාපනය යන්නට මානව ලිංගික කාය විච්ඡේදනය හා ප්‍රජනනය පමණක් නොව ලිංගික දිශානතිය, ස්ත්‍රී/පුරුෂ සමාජභාව අනන්‍යතාව ආදී කාරණාද ඇතුළත් වේ. ඉහත කී මධ්‍ය කාලීන නිර්දේශ අතර එකී මාතෘකා පිළිබඳ සඳහනක් නොමැත. |
| **මහජන සෞඛ්‍ය පරීක්ෂක අත්පොත :**<br><br>මානසික හා කායික හිංසනය හා දරුවන් අවමානයට ලක් කිරීම වැලැක්වීම සහ මානසික කම්පනය වැළැක්වීම සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන ප්‍රතිපත්ති සම්පාදනයේදී හා ක්‍රියාත්මක කිරීමේදී මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් පාසල් වෙත සහාය දැක්විය යුතු බව මෙම අත්පොතේ 9 වන පරිච්ඡේදයෙහි සඳහන් වේ. | එවන් අවමානයට ලක් කිරීම් හෝ හිංසනයන්ට බලපාන විවිධාකාර හේතු තිබිය හැකි අතර ලිංගික දිශානතිය සහ/හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාව අනන්‍යතාව/ප්‍රකාශනයද ඉන් එකකි. ඒ සම්බන්ධ සඳහනක් මෙහි නොමැත.<br><br>නිදසුනක් ලෙස, LGBT සිසුන්ගෙන් 70% කටම පාසලේදී අනාරක්ෂිතභාවයක් හැඟුණු බව ඇමෙරිකා එක්සත් ජනපදයෙහි සිදු කරන ලද එක්තරා අධ්‍යයනයකදී සොයා ගැණුනු අතර, චීනයේදී සිදු කරන ලද අධ්‍යයනයකදී ප්‍රතිචාර දැක්වූ LGBT සාමාජිකයන් අතරින් 59% ක් ඇසුරින් වාර්තා වූයේ අවමානයට ලක් කිරීම් හේතුවෙන් ඔවුන්ගේ අධ්‍යාපනය වෙත ඍණාත්මක බලපෑම් එල්ල වී ඇති බවකි. සම වයස් කණ්ඩායම් අතින් සිදු වන අවමන් කිරීම් හා පීඩනය පිළිබඳව සිදු කරන ලද අධ්‍යයනයකදී (2012) හෙළි වූයේ ශ්‍රී ලංකාවේ 13-16 වයස් කාණ්ඩයට අයත් පාසල් පිරිමි සිසුන් අතරින් 68% ක් සහ සිසුවියන් අතරින් 51.2% ක් විවිධ අවමන් කිරීම්වල වින්දිතයන් වූ බවයි. ඔවුන් අතරින් 23%ක් නින්දා කිරීම්වලට (අන්වර්ත නාම පටබැඳීම ආදී) ලක්ව තිබිණ. එහි ප්‍රතිඵලයක් ලෙස පාසල් නොපැමිණ සිටීමේ ප්‍රවණතාව 23% ක් ලෙස වාර්තා විය. |
| **7 ශ්‍රේණියේ සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන ගුරුවරුන් සඳහා වූ මාර්ගෝපදේශය (2016) :**<br><br>7 ශ්‍රේණියේ සිසුන් හට සෞඛ්‍ය චර්යාව පිළිබඳව ඉගැන්වීමට ගුරවරුන්ට මාර්ගෝපදේශ ලබා දී ඇති නමුත් එයට ඇතුළත් වන්නේ විරුද්ධ ලිංගිකයන් කෙරෙහි ඇති වන හැඟීම්/ආකර්ෂණය පමණි. | මෙම විෂය මාලාව මගින් අවධානය යොමු කෙරෙනුයේ විෂමරිසි දෙමාපියන් සිටින පවුල්, විරුද්ධ ලිංගිකයන් කෙරෙහි ඇති වන හැඟීම්, විවාහය ආදී කාරණා ගැන පමණක් හෙයින් මෙය හුදෙක්ම ඒකමානීය ස්වභාවයක් උසුළයි. එමෙන්ම සමාන ලිංගිකයන් කෙරෙහි ඇති වන හැඟීම් අසාමාන්‍ය හෝ සෞඛ්‍යයට අහිතකර භාවිතයන් බවද මින් වැරදි ලෙස ගම්‍ය කෙරේ. එවැනි ඉගැන්වීම් ක්‍රම හේතුවෙන් සිසුන් වෙත ලිංගික දිශානතිය සහ/හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාව/ප්‍රකාශනය සම්බන්ධ නිවැරදි තොරතුරු නොලැබී යාමක් සිදු වේ. එපමණක්ද නොව, විවිධ ලිංගික දිශානති සහ/හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතා/ප්‍රකාශන සහිත පුද්ගලයන් හට වෙනස් කොට සැලකීම සහ ඔවුන් ආන්තිකකරණයට ලක් කිරීම කුඩා අවධියේ සිටම සිසුන්ගේ සිත් තුළට කාවැද්දේ. |

| | |
|---|---|
| **8 ශ්‍රේණියේ සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන ගුරුවරුන් සඳහා වූ මාර්ගෝපදේශය (2017) :**<br><br>ගුරුවරුන් සඳහා නිකුත් කර ඇති මාර්ගෝපදේශයට අනුව සහකම්පනය දැක්වීම මනෝ-සමාජයීය නිපුණතා අතරින් එකක් ලෙස සඳහන් වේ. මෙම සහකම්පනය දැක්වීම යටතේ එහි සඳහන් වන්නේ 'දුර්වලතා සහිත පුද්ගලයන් අවමානයට ලක් කිරීමෙන් වැළකිය යුතු' බවයි. | එහෙත්, එහි 'දුර්වලතා සහිත පුද්ගලයන්' යන්න නිර්වචනය නොවේ. එනම්, එකී උපකල්පිත දුර්වලතා කවරේද යන්න එම ලේඛනයෙහි සඳහන් නොවේ. අවමානයට ලක් කිරීම් සිදු වන්නේ හුදෙක්ම 'දුර්වලතා' නිසා පමණක් නොව වයස, ආගම/වාර්ගිකත්වය, ධනය හා සමාජ-ආර්ථික තත්ත්වය, රුචි අරුචිකම් සහ විනෝදාංශ, ලිංගික දිශානතිය සහ/හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාව/ප්‍රකාශනය ආදී විවිධ සාධක පාදක කරගෙන සිදු වන උපකල්පිත වෙනස්කම් සහ 'අන්‍යකරණයට ලක් කිරීම්' හේතුවෙන් බව සැලකිය යුතු මනාය. එකී සාධක අතරින් වැදගත් ස්ථානයක් ලිංගික දිශානතිය සහ/හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාව/ප්‍රකාශනය යන සාධකය වෙත හිමි වුවද එකී ගැටළු කිසිවක් සාකච්ඡා කොට මෙන්ම සඳහන් කොටද නොමැත. |
| **10 ශ්‍රේණියේ සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන ගුරුවරුන් සඳහා වූ මාර්ගෝපදේශය (2015) :**<br><br>සම-ලිංගික හැඟීම්/චර්යාවන් ඇති වීම ලිංගික හිංසනයක් හෝ අපයෝජනයක් ලෙස නිශ්චය කොට දක්වා ඇත. | ලිංගික දිශානතිය සහ/හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාව/ප්‍රකාශනය ආශ්‍රිත විවිධත්වය පිළිබඳ නිවැරදි තොරතුරු බෙදා හැරීම වෙනුවට එම සාධකය දුරාචාරයක් ලෙස හංවඩු ගසා ඇත. EQUAL GROUND විසින් සිදු කරන ලද අධ්‍යයනයකදී LGBTIQ ප්‍රතිචාර දැක්වූවන් පාසල් විස්තර කළේ ඉගෙනුම් හිතකර පරිසරයක් වෙනුවට පීඩනාත්මක පරිසරයක් පවතින ස්ථාන ලෙස ය. ගුරුවරුන් යනු දරුවන්ගේ අධ්‍යාපනයේ මෙන්ම පාසල් අත්දැකීමෙහි උපස්ථම්භක පිරිසක් හෙයින් ඉහත කී  කණගාටුදායක ප්‍රතිඵල පසුපස ඇති හේතු මෙම ගුරු අත්පොත් විශ්ලේෂණයෙන් පැහැදිලි වේ. LGBTIQ පුද්ගලයන් සහ විවිධ ලිංගික දිශානතින් සහ/හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතා/ප්‍රකාශන සම්බන්ධයෙන් ඔවුනට සාවද්‍ය තොරතුරු ඉගැන්වුව හොත් නිසැක වශයෙන්ම එකී තොරතුරු සිසුන් වෙතද ගලා ගොස් ගුරුවරුන් අතින්ද LGBTIQ සිසුන් ආන්තිකකරණය හා වෙනස් කොට සැලකීමට ලක් වීමට මග පෑදේ. |
| **ලිංගිකත්වය සහ ස්ත්‍රී/පුරුෂ සමාජභාවය පාදක හිංසනය පිළිබඳ ජාතික කාර්ය සැලැස්ම (2016-2020):**<br><br>අධ්‍යාපන අංශය තුළ සිදු කළ යුතු ප්‍රධානතම ක්‍රියාකාරකම්වලින් එකක් වන්නේ ලිංගික දිශානතිය හා ස්ත්‍රී/පුරුෂ සමාජභාවය පාදක හිංසනය පිළිබඳ අන්තර්ක්‍රියාකාරී පුහුණු මූලාශ්‍ර සකස් කිරීම සහ ඒවා නිරන්තර පුහුණු වැඩසටහන්/උපදේශන මාර්ගෝපදේශන පුහුණු වැඩසටහන්/ පාසල් පාදක ගුරු පුහුණු සැසි/ පූර්ව-සේවා ගුරු පුහුණු වැඩසටහන් ආදියට අන්තර්ගත කිරීමයි. | CARE International (2013) විසින් 'ස්ත්‍රී/පුරුෂ සමාජභාවය පුළුල් කිරීම' පිළිබඳව සිදු කරන ලද අධ්‍යයනයක්: පුරුෂෝත්තමවාදී දෘෂ්ටිවාද අදාළ වන්නේ ඇයි? - ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක හතරක් ආශ්‍රිත ආකල්ප, භාවිතයන් සහ ස්ත්‍රී/පුරුෂ සමාජභාවය පාදක හිංසනය. මෙම අධ්‍යයනයේදී පුරුෂයන් අතරින් 4% ක් සමරිසි භීතිකාව පාදක හිංසනයට මුහුණ දී ඇති බව වාර්තා කළ අතර තවත් 4%ක් කිසියම් පුරුෂයෙකු අතින් හෝ ලිංගික අපයෝජනයට පාත්‍ර වී තිබුණි.<br><br>ලිංගිකත්වය සහ ස්ත්‍රී/පුරුෂ සමාජභාවය පාදක හිංසනය යන්නෙන් අදහස් වන්නේ කෙනෙකුගේ ස්ත්‍රී/පුරුෂ සමාජභාවය සහ/හෝ ලිංගික දිශානතිය පදනම් කරගෙන ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලික ජීවිතවලදී සිදු කෙරෙන කායික, මානසික හෝ ලිංගික හිංසනයන්, එවැනි ක්‍රියා සිදු කරනු ලබන බවට සිදු කරන තර්ජන, බලහත්කාරය පෑම් හා පුද්ගල නිදහස වළක්වාලන අනෙකුත් ක්‍රියා වේ. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැලැක්වීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනය ප්‍රකාරව ලිංගිකත්වය යන්න විවිධත්වයෙන් යුතු දෙයක් වන අතර ඉන් අදහස් වන්නේ එමගින් විවිධ ලිංගික දිශානති සහ/හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතා/ප්‍රකාශන ආවරණය කෙරෙන බවකි. මේ නිසා, LGBTIQ පුද්ගලයන් අත්විඳින විවිධ සිදුවීම්ද ලිංගිකත්වය සහ ස්ත්‍රී/පුරුෂ සමාජභාවය පදනම් වූ හිංසනයට ඇතුළත් වන නමුදු මෙහි ඒ ගැන කිසිදු සඳහනක් නැත. |

| | |
|---|---|
| **නවක වධ පනත :**<br><br>නවක වධයට එරෙහිව දණ්ඩන පැනවීම සඳහා අවශ්‍ය විධිවිධාන මෙම පනතෙහි දැක්වේ. | එහෙත්, මෙහි නවක වධය යන්නට ලබා දී ඇති නිර්වචනයට ලිංගික දිශානතිය හෝ සමරිසි භීතිකාව නිසා සිදු කෙරෙන පහරදීම්/හිංසනයන් ආදිය ඇතුළත් නොවේ.<br>නවක වධ පනතක් ඇති නමුදු ඇතැම් විශ්වවිද්‍යාල සිසුන් සමරිසි භීතිකාව පාදක ප්‍රචණ්ඩත්වයෙහි හා හිංසනයේ ගොදුරු බවට පත් වන සිදුවීම් තවමත් වාර්තා වුවද ඒ සම්බන්ධයෙන් නිසි පියවරක් නොගැනීමට හේතුව වන්නේද එම සමරිසි භිතිකාවයි |
| **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ පැමිණිලි කිරීමේ පටිපාටිය:**<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින්ද 2017 වර්ෂයේදී කවර හෝ ආකාරයකින් හිංසනයට ලක් වන ඕනෑම අයෙකුට අන්තර්ජාලය ඔස්සේ මෙන්ම ආරක්ෂිත දුරකතන ඇමතුම් ඔස්සේ පැමිණිලි ඉදිරිපත් කිරීමට හැකි ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ලැබිණ. | කෙසේ වුවද. අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විවිධ ලිංගික දිශානති සහ/හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතා/ප්‍රකාශන නියෝජනය කරන පුද්ගලයන් අවමානයට හෝ හිංසනයට ලක් කිරීමේ සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කිරීම පිළිබඳ අවශ්‍ය සංවේදී පුහුණුවක් නවක වධ සිදුවීම්වලට ප්‍රතිචාර දක්වන්නන් හට ලැබෙන්නේද යන්න අපැහැදිලිය.<br><br>එමෙන්ම, අධ්‍යාපන ආයතන තුළ LGBTIQ පුද්ගලයන් සහ ඔවුන්ට මුහුණ පාන්නට සිදු විය හැකි අවමන් කිරීම් හා හිංසනයන් දැනට පවතින කිසිදු දේශීය ප්‍රතිචාර යාන්ත්‍රණයක සුවිශේෂයෙන් සඳහන් වී නොමැත. |
| **මනෝ-සමාජයීය උපකාරක හා උපදේශන ඒකකය:**<br><br>පාසල් මට්ටමේ උපදේශන සේවාවන්ට අදාළ ගැටළු ආමන්ත්‍රණය කිරීමේ වගකීම දරන මෙම ඒකකය ක්‍රියාත්මක වන්නේ ශාඛාවක ශාඛාවක් වශයෙනි (එනම් සම-විෂයමාලා ක්‍රියාකාරකම්, මාර්ගෝපදේශන සහ උපදේශන හා සාම අධ්‍යාපනය යටතේ තවත් බොහෝ උප ශාඛා අතර වේ). එම හේතුව නිසා ඒ සඳහා ලැබිය යුතු නිසි අවධානය ඊට නොලැබී යයි | ප්‍රගතිශීලී වැඩිදියුණුවීම් දක්නට ලැබුණද ශ්‍රී ලංකාවේ පාසල් මට්ටමේ උපදේශනට අදාළ ඇතැම් ගැටළු හේතුවෙන් එහි ප්‍රගතිය සීමා කරනු ලැබ තිබේ. ඒ අතරින් අතිශයින්ම දුෂ්කර කාරණය වන්නේ පාසල් උපදේශකයන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොසිටීමයි. නිදසුනක් ලෙස, 4,004,086 ක් වූ පාසල් සිසුන් පිරිසකට අවශ්‍ය මනෝ-සමාජයීය උපදේශන සේවා ලබා දීම වෙනුවෙන් ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාසල්වල සේවය කරනුයේ මාර්ගෝපදේශන ගුරුවරුන් 1,086 ක් බව අධ්‍යාපන අමාත්‍යාංශය (2012) වාර්තා කර ඇති අතර මේ අනුව උපදේශක/සිසු අනුපාතය 1:3687 ක් වේ.<br><br>එමෙන්ම, ලිංගික දිශානති සහ/හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතා/ප්‍රකාශන ආශ්‍රිත ගැටළු සම්බන්ධයෙන් නිසි සංවේදීකරණය සහ පුහුණුව මෙම උපදේශකයන් වෙත ලැබෙන්නේ නැත. තමන්ට ඇති ගැටළු සම්බන්ධයෙන් සිසුන් එම උපදේශකයන් වෙත යොමු වීමට මැලිකමක් දැක්වීමටද එය හේතුවක් වෙයි. |

## රැකියා නියුක්තිය

දැනට ස්ථාපිතව පවතින අසමවාදී ද්විමය ස්ත්‍රී පුරුෂ සම්මත වලට අනුගත නොවන ලිංගික දිශානතියක් සහ/හෝ ස්ත්‍රී/පුරුෂ සමාජභාව අනන්‍යතාවක් දරන පුද්ගලයෙකු තමන් සේවය කරන ස්ථානයේදී වෙනස්කොට සැලකීමට ලක් විය හැක. 'කිසිවෙකු අත් නොහැරීම' වෙනුවෙන් වූ 2030 තිරසාර සංවර්ධන ඉලක්ක න්‍යාය පත්‍රයේ අරමුණු සාක්ෂාත් කිරීමට මූලික අභියෝගයක් සේවා ස්ථානවලදී LGBTIQ පුද්ගලයන් වෙනස්කොට සැලකීම නිසා එල්ල වේ. ඒ අනුව බලන කල, ස්ත්‍රී/ පුරුෂ සමාජභාව සමානාත්මතාව (5 ඉලක්කය), ශිෂ්ටසම්පන්න සේවා ස්ථාන (8 ඉලක්කය) සහ අසමානතා තුරන් කිරීම (10 ඉලක්කය) ඇතුළු තිරසාර සංවර්ධන ඉලක්ක රැසක්ම සාක්ෂාත් කර ගැනීමට නම් සේවා ස්ථාන ආශ්‍රිත වෙනස් කොට සැලකීමේ සිද්ධිවලට විසඳුම් සෙවීම අතිශය වැදගත් පියවරක් වේ.

සේවා ස්ථාන ආශ්‍රිත වෙනස් කොට සැලකීම සම්බන්ධයෙන් EQUAL GROUND විසින් සිදු කරන ලද අධ්‍යයනයක් (2021) මගින් හෙළි වූයේ ඊට සහභාගී වූ ප්‍රතිචාර දැක්වූවන් අතරින් අඩක්ම පාහේ (42%) සිය සේවා ස්ථානයේදී තම ලිංගික දිශානතිය සහ/හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාව/ප්‍රකාශනය හෙළිදරව් නොකළ බවකි. සේවා ස්ථානයේදී තම ලිංගික දිශානතිය සහ/හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාව/ප්‍රකාශනය හෙළි කළහොත් වැඩි වශයෙන් අවමානයට හා වෙනස් කොට සැලකීමට ලක් වීමට තමන්ට සිදු විය හැකි බව එම ප්‍රතිචාර දැක්වූවන් අතරින්

අඩක් (50%) විශ්වාස කිරීමද ඊට හේතුවකි. LGBTIQ අනන්‍යතා සහිත සේවකයන් සිය සේවා ස්ථානවලදී තම සත්‍ය අනන්‍යතාව හෙළි කිරීම සම්බන්ධයෙන් දැඩි අර්බුදයකට මුහුණ පාන බව ඉන් හැඟවේ.

එම අධ්‍යයනය මගින් සිදු වූ තවත් හෙළිදරවු කිරීමක් වූයේ සහභාගී වූ 58% දෙනෙකු තමන් හට වාචික හිංසනයට මුහුණ පාන්නට සිදු වූ බවත්, 31% දෙනෙකු තමන් හට ලිංගික හිංසනයන්ට මුහුණ පාන්නට සිදු වූ බවත් ප්‍රකාශ කළ බව ය. එවැනි සිදුවීම් සම්බන්ධයෙන් ඉහළ කළමනාකාරීත්වයට පැමිණිලි කිරීමට හැකියාවක් තිබේදැයි ඔවුන්ගෙන් විමසූ විට 44% ක ප්‍රතිචාරය වූයේ තවතවත් අපහසුතාවලට මුහුණ පාන්නට සිදු විය හැකි බවට ඇති බිය නිසා ඔවුනට එසේ කළ නොහැකි බවයි. LGBTIQ සේවකයන් හට තම සේවා ස්ථානයේදී වාචික සහ/හෝ ලිංගික හිංසනයට මුහුණ පාන්නට සිදු වුවද තවදුරටත් වෙනස් කොට සැලකීම් සහ/හෝ අවමන් කිරීම්වලට ලක් වීමට සිදු විය හැකි බවට ඇති බිය නිසා එවුන් නිහඬව සිටින බව මින් ගම්‍ය වේ.

| දැනට පවතින ලේඛන/යාන්ත්‍රණ | සලකා බැලිය යුතු ක්ෂේත්‍ර |
|---|---|
| **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වගන්තිය**<br><br>නීතිය ඉදිරියේ සමානාත්මතාව සහ සෑම පුද්ගලයෙකුම වෙනුවෙන් එක සමාන ලෙස නීතියේ ආරක්ෂාව හිමි බව සහතික කරයි. ජන වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය, දේශපාලනික මතය සහ උපන් ස්ථානය හෝ එවැනි හේතූන් මත පදනම්ව පුද්ගලයන්ට වෙනස් ලෙස සැලකීමද එමගින් තහනම් කෙරෙයි. | කෙසේ වෙතත්, ලිංගික දිශානතිය සහ/හෝ ස්ත්‍රී/පුරුෂ සමාජභාවය පිළිබඳ කිසිදු සඳහනක් නොමැත. මේ නිසා, කෙනෙකුගේ ලිංගික දිශානතිය සහ/හෝ ස්ත්‍රී/පුරුෂ සමාජභාව අනන්‍යතාව හෝ ප්‍රකාශනය මත පදනම්ව සිදු කෙරෙන වෙනස් කොට සැලකීම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහනම් නොකෙරේ. |
| **වෙනස් කොට සැලකීම (සේවා නියුක්තිය සහ වෘත්තිය) පිළිබඳ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතිය (සී 111), 1958:**<br><br>ශ්‍රී ලංකාව මේ වන විටත් මෙම සම්මුතිය පිළිගෙන ඇත. සේවා ස්ථාන හා වෘත්තීන්හිදී අවස්ථාවන්හි සමානත්වය සහ සමානව සැලකීම ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් ''ප්‍රකාශනය පත් කොට එය අනුගමනය කිරීමට'' එහි 111 වන සම්මුතිය මගින් රාජ්‍යයන් දිරිමත් කෙරේ. | එහෙත්, හාස්‍ය උපදවන කරුණක් වන්නේ LGBTIQ අනන්‍යතා දරන සේවකයන්ට අදාළ වන වෘත්තීමය කාරණා ආශ්‍රිත වෙනස් කොට සැලකීම් වැළැක්වීම සඳහා කිසිදු සුවිශේෂී විධිවිධානයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ කම්කරු නීති සංග්‍රහයේ අන්තර්ගත නොවීමයි. |
| **ජාතික මානව සම්පත් සහ සේවා නියුක්ති ප්‍රතිපත්තිය :**<br><br>තරුණ ප්‍රජාව වෙනුවෙන් වන වෘත්තීය අවස්ථා ඉහළ නංවනු පිණිස අඩුවරප්‍රසාදිත හා උවදුරට මුහුණ පාන පිරිස් වෙනුවෙන් සුවිශේෂී වැඩසටහන් මෙහි දැක්වේ. ශ්‍රම බලකායයෙහි සමාජ ආරක්ෂාව සුරක්ෂිත කිරීම සඳහා වූ ප්‍රතිපත්තිමය යෝජනා යටතේ ජාතික මානව සම්පත් සහ සේවා නියුක්ති ප්‍රතිපත්තිය මගින් එක සමාන වෘත්තීය අයිතිවාසිකම් ලබා දීම සහ අවමානයෙන් හා වෙනස් කොට සැලකීමෙන් තොර සේවා පරිසරයක් ඇති කිරීම පිළිබඳවද එහි දැක්වේ. | කෙසේ වෙතත්, මෙම කාණ්ඩය යටතට අයත් වන්නේ කවර පුද්ගලයන්ද යන්න පිළිබඳ සුවිශේෂී විග්‍රහයක් එහි දක්නට නොලැබේ. එමෙන්ම, ලිංගිකමය සුළුතර කණ්ඩායම් ගැනද එහි සඳහනක් නැත.<br><br>ඉහත කී ප්‍රතිපත්ති යෝජනාව අදාළ වන්නේ හුදෙක්ම එච්අයිවී/ඒඩ්ස් ආසාධිත සේවකයන්ට පමණි. |

| | |
|---|---|
| **ශිෂ්ට සම්පන්න සේවයක් සහිත රට වැඩසටහන:**<br><br>''2022 වන විට අසමානතා සමනය කිරීම සහ අන්තර්ග්‍රාහී හා ප්‍රතිචාරාත්මක තීරණ ගැනීමේ ක්‍රියාවලියක් සහතික කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ජනතාව වෙත වැඩිදියුණු කරන ලද දත්ත සහ දැනුම කළමනාකරණයක ප්‍රතිලාභ හිමි වන බව'' සහතික කරනු පිණිස එක්සත් ජාතීන්ගේ සංවිධානය හා ශ්‍රී ලංකා රජය විසින් එකමුතු කැපවීමක් සිදු කිරීමට බැඳී ඇති බව ශිෂ්ට සම්පන්න සේවයක් සහිත රට වැඩසටහනේ නවතම අදියරේදී අවධාරණය කෙරේ. | කෙසේ වෙතත්, LGBTIQ සේවකයන්ටද අදාළ වන සේවා ස්ථාන ආශ්‍රිත අසමානතාවලට විසඳුම් සෙවීමට උපකාරී වන එවැනි ප්‍රයත්න කිසිවක් 2022 වන විටත් දියත් කර නොමැත. |
| **2025 දැක්ම :**<br><br>තිරසාර සාමය, සමානාත්මතාව, සියලුම දෙනාගේ මානව අයිතිවාසිකම් සහ අප සමාජයේ බහුත්වවාදී ස්වභාවය නගා සිටුවීම, ප්‍රවර්ධනය කිරීම සහ සුරක්ෂිත කිරීම සහ රටේ අන්තර්ග්‍රාහී හා අපක්ෂපාතී වර්ධනය හා සංවර්ධනය පිළිබඳව සඳහන් වේ. | අන්තර්ග්‍රාහී සංවර්ධනය සාක්ෂාත් කර ගනු පිණිස කාන්තාවන්, තරුණයන් සහ ආබාධිතතා සහිත පුද්ගලයන් ඇතුළු විවිධ කාණ්ඩ ශ්‍රම බලකායයට අන්තර්ගත කිරීමට එමගින් යෝජනා වන නමුදු LGBTIQ ප්‍රජාව සම්බන්ධයෙන් කිසිදු සඳහනක් නැත. |
| **සේවා ස්ථාන ආශ්‍රිත ලිංගික හිංසනය වැළැක්වීම සහ ඊට එරෙහිව පියවර ගැනීම සඳහා වන පිළිවෙත් සංග්‍රහය සහ මාර්ගෝපදේශ :**<br><br>පිරිමියෙකු විසින් කාන්තාවක හෝ වෙනත් පිරිමියෙකු හෝ කාන්තාවක විසින් තවත් කාන්තාවක හෝ පිරිමියෙකු හිංසනයට ලක් කිරීම ලිංගික හිංසනයට ඇතුළත් විය හැකි බව එහි දැක්වේ.<br><br>එමෙන්ම, ලිංගික හිංසනය යන්න ලිංගිකත්වය සහ/හෝ ලිංගික දිශානතිය පදනම්ව සිදු විය හැකි බවද එහි දැක්වේ. පුද්ගලයෙකුගේ ස්ත්‍රී පුරුෂභාවය සහ/හෝ ලිංගික අනන්‍යතාව සම්බන්ධයෙන් වාචික හිංසනයක්, අවමානයට ලක් කිරීම මෙම පිළිවෙත් සංග්‍රහයට ඇතුළත් වන අතර LGBTIQ සේවකයන්ද ඊට අයත් විය හැක. | LGBTIQ සේවකයන්ට අදාළ ගැටළුද මෙම පිළිවෙත් සංග්‍රහයට ඇතුළත් විය යුතු නමුදු එකී පුද්ගලයන්ට එරෙහිව සේවා ස්ථානවල සිදු වන ලිංගික හිංසනයන් සම්බන්ධයෙන් ගත යුතු විධිවිධාන කිසිවක් කම්කරු නීතිය යටතේ දක්නට නොලැබීම පුදුම එළවන කරුණකි.<br><br>ලිංගික හිංසනය සම්බන්ධයෙන් විධිවිධාන ඇතුළත් වන්නේ ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ (345 වගන්තිය) පමණි. වැඩිහිටියන් දෙදෙනෙකු සිය කැමැත්ත මත පවත්වනු ලබන සමරිසි සබඳතා සාපරාධීකරණය කරන විධිවිධානද මෙම දණ්ඩ නීති සංග්‍රහයේම (365 සහ 365අ වගන්ති) ඇතුළත් වන අතර LGBTIQ පුද්ගලයන්ට අදාළ හිංසනකාරී සිදුවීම් වාර්තා කිරීම සම්බන්ධව සලකා බැලූ කල පරස්පර විරෝධී තත්ත්වයක් එමගින් උද්ගත වේ.<br><br>අනෙක් අතට, රාජ්‍ය නිලධාරීන් විසින් සිදු කරන ලිංගික හිංසනයන් සඳහා විධිවිධාන අල්ලස් පනතේ අන්තර්ගත වේ (19 වගන්තිය). |
| **කාර්මික ආරවුල් පනත:**<br><br>රාජ්‍ය සේවය සඳහා ලිංගික හිංසනයන්ද ඇතුළුව සේවා ස්ථානවලට අදාළ ආරවුල් සම්බන්ධයෙන් විධිවිධාන මීට ඇතුළත් වේ. | කෙසේ වෙතත්, සේවා ස්ථාන ආශ්‍රිත ලිංගික හිංසනය පිළිබඳ කිසිදු සඳහනක් එහි හමු නොවේ. |

# අනෙකුත්/අසල්වැසි රටවල් වෙතින් නිදසුන්

## අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ

2018 දී ශ්‍රී ලංකාවට ආසන්නතම රට වන ඉන්දියාව ලිංගික අධ්‍යාපන වැඩසටහන් හඳුන්වා දෙන ලදි. මේ අතරම. ඉන්දියානු සෞඛ්‍ය අමාත්‍යාංශය ලිංගිකත්වය පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම වෙනුවෙන්ද කටයුතු කරමින් සිටී. 2017 දී එරට රජය ප්‍රකාශ කර සිටියේ ''සමරිසි හැඟීම්'' ස්වභාවික වන බවයි. පිරිමි හා කාන්තා සමරිසි, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී හා අන්තර්ලිංගික පුද්ගලයන් වෙනස් කොට සැලකීමට ලක් කෙරෙන හා ඔවුන්ව අවිද්‍යාත්මක ලෙස හුවා දැක්වෙන කාරණා ඉවත් කොට පාඨ ග්‍රන්ථ හා විෂයමාලා සංශෝධනය කරන මෙන් ඉන්දියාවේ ජාතික වෛද්‍ය කොමිසම ප්‍රකාශකයන් හා වෛද්‍ය විද්‍යාල වෙත නියෝග කර තිබේ. එමෙන්ම, නැම්බියාවේ ජීවන නිපුණතා විෂය මාලාවටද විවිධ ලිංගික අනන්‍යතා පිළිබඳ ඉගෙන ගැනීම සහ සාකච්ඡා කිරීම ඇතුළත් කර තිබේ.

නෙදර්ලන්ත තානාපති කාර්යාලයේ සහාය ඇතිව NGO Society for People's Awareness Care and Empowerment (SPACE) සංවිධානය විසින් දිල්ලි රජයේ අධ්‍යාපන අධ්‍යක්ෂ මණ්ඩලය හා එක්ව 2019 දී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියක් යටතේ විවිධ වැඩමුළු හා සංවේදීතාව ඉහළ නැංවීමේ වැඩසටහන් රැසක් පාසල් ආශ්‍රිතව පවත්වන ලදි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කොට මාස අටක් ගත වූ පසුව රාජ්‍ය පාසල් 25 ක් ද ඇතුළු පාසල් 27 ක් ''සංක්‍රාන්ති හිතකර'' පාසල් ලෙස සහතිකකරණයට ලක් කර තිබේ.

ඉන්දියාවේ නවක වධ පනත සහ ඒ හා සබැඳි ප්‍රතිපත්තිවලද සමරිසි පුද්ගලයන්ට එල්ල වන හිංසනයන් සුවිශේෂයෙන් අන්තර්ගත කර තිබේ[1]. පිලිපීනයේ අවමානයට ලක් කිරීමට එරෙහි වීමේ පනතට අදාළ ක්‍රියාත්මක කිරීමේ රීති හා රෙගුලාසි අතරටද ලිංගික දිශානතිය හා ස්ත්‍රී/පුරුෂ සමාජභාව අනන්‍යතාව මත පදනම්ව සිදු කෙරෙන අවමානයට ලක් කිරීම් පිළිබඳව සඳහන් වේ. ද්විතීයික පාසල්වල සමරිසි භීතිකාව නිසා සිදු කෙරෙන අවමානයට ලක් කිරීම් පිළිබඳ සමීක්ෂණයක් කොලොම්බියාවේ බොගෝටා දිස්ත්‍රික් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදි. පාසල් අධ්‍යාපනය ලබන සංක්‍රාන්ති හා අන්තර්ලිංගික සිසුන්ගේ තත්ත්වය සුවිශේෂයෙන් ආමන්ත්‍රණය කෙරෙන වෙනස්කොට සැලකීම වළක්වන ප්‍රතිපත්තියක් මෝල්ටා රාජ්‍යය විසින් ක්‍රියාත්මක කර තිබේ.

2014 වර්ෂයේදී නේපාලයේ 6, 7 සහ 8 ශ්‍රේණි සඳහා වූ ලිංගිකත්ව හා ප්‍රජනන සෞඛ්‍ය විෂය මාලාවේ කොටසක් වශයෙන් ලිංගිකත්වය හා ස්ත්‍රී/පුරුෂ සමාජභාව විවිධත්වය ඇතුළත් කිරීමට එරට අධ්‍යාපන පරිපාලන මණ්ඩලය පියවර ගත්තේය.

**මහාරාෂ්ට්‍ර ප්‍රාන්ත රජය විසින්ද තම 11 ශ්‍රේණියේ සමාජවිද්‍යා පාඨ ග්‍රන්ථය (2019-20 අධ්‍යයන වර්ෂය සඳහා වූ) සංශෝධනය කරන ලද අතර මේ වන විට තනි දෙමාපිය පවුල්, එක්ව වාසය කරන සබඳතා, සමරිසි දෙමාපියන් සහිත පවුල් සහ හදාවඩා ගන්නා දෙමාපියන් සහිත පවුල් ආදී වශයෙන් රට පුරා දැකිය හැකි විවිධ වර්ගයේ පවුල් එහි දැක්වේ. සමරිසි විවාහ, ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයටම සමානව සැලකීම සහ විවිධ සංස්කෘතික සම්ප්‍රදායයන් මුහු කිරීම ආදී කාරණා ගැනද එම පාඨ ග්‍රන්ථයේ සඳහන් වේ.**

## සේවා ස්ථාන/රැකියා අංශය

අයර්ලන්තයේ සමානාත්මතාව හා විවිධත්වය ඉලක්ක කරගත් උපායමාර්ග හේතුවෙන් එරට ශ්‍රම බලකායයෙහි නවෝත්පාදනය 7.9% කින් ඉහළ ගොස් ඇති අතර සේවක ඵලදායීතාව ආශ්‍රිතවද 6.5% ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. සේවා ස්ථාන ආශ්‍රිත සමානාත්මතාව හා විවිධත්වය ප්‍රවර්ධනය කිරීම මේ වන විට රාජ්‍ය ජාතික ශ්‍රම බලකා උපායමාර්ගයන් ක්‍රියාත්මක කිරීමේදී ඉහළ ප්‍රමුඛතාවක් ලබා දෙන සාධකයක් බවට පත්ව ඇති බවට එය කදිම සාක්ෂියකි.

---

1තාක්ෂණික අධ්‍යයන ආයතනවල නවක වධය වැළැක්වීම හා තහනම් කිරීම උදෙසා නීති රීති හා රෙගුලාසි තදින්ම ක්‍රියාත්මක කිරීමට නියොග කරමින් ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණය 2007. 5. 16 දිනැති ආඥාවක් නිකුත් කළේය.
See: http://nitm.ac.in/uploads/33575b4f0170d73f80586a96fff94332.pdf

සමානාත්මතාව සඳහා ඇති අයිතිවාසිකම තහවුරු කරනු පිණිස ලිංගික සුළුතර ප්‍රජාවන්හි (අනෙකුත් සුළුතර ප්‍රජාවන්ද ඇතුළුව) අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වෙනුවෙන් විශේෂ නෛතික විධිවිධාන හඳුන්වා දිය හැකි බව නේපාල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18(3) වගන්තියේ දැක්වේ.

අන්තර්ග්‍රාහී සංස්කෘතිය සවිබල ගැන්වීම සහ සේවා ස්ථාන ආශ්‍රිතව LGBTIQ අනන්‍යතා සහිත සේවකයන් හටද සමාන අයිතිවාසිකම් ලබා දෙනු පිණිස තවදුරටත් ඉදිරි පියවරක් සනිටුහන් කරමින් ඉන්දියාවේ Tata Steel සමාගම විසින් නව මානව සම්පත් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව, LGBTIQ ප්‍රජාව නියෝජනය කරන සේවකයන් හට නීතිය යටතේ අවසර ලැබෙන සියලුම මානව සම්පත් ප්‍රතිලාභ ලබා ගැනීමට ඉඩකඩ විවර වේ. වැඩිදියුණු කරන ලද විවිධත්ව හා අන්තර්ග්‍රාහී ප්‍රතිපත්තිය යටතේ එම සමාගමේ සේවකයන් හා ඔවුන්ගේ හවුල්කරුවන් හට සෞඛ්‍ය පරීක්ෂා, වෛද්‍ය ප්‍රතිලාභ, සබැඳි නිවාස ඒකක, හදාවඩා ගැනීමේ නිවාඩු, ප්‍රසූති නිවාඩු, දරුවන් රැකබලා ගැනීම සඳහා නිවාඩු හා සේවක උපකාරී වැඩසටහනට ඇතුළත් වීමේ අවස්ථාව ඇතුළු ප්‍රතිලාභ රාශියක් භුක්ති විඳීමට හැකි වනු ඇත. එමෙන්ම, මෙම සේවකයන් හට ජනනේන්ද්‍රි පරිවර්තනය කිරීමේ සැත්කම් සඳහා මූල්‍ය සහාය මෙන්ම ඒ වෙනුවෙන් දින 30 ක විශේෂ නිවාඩු කාලයක්ද හිමි වනු ඇත.

## ඉදිරි දැක්ම

ප්‍රතිපත්ති, නිර්දේශ සහ මැදහත් වීම් දැක්වෙන විවිධ ලේඛන රාශියක් සමාලෝචනය කිරීමේදී පැහැදිලි වන කරුණක් වන්නේ ලිංගික දිශානතීන් හා ස්ත්‍රී/පුරුෂ සමාජභාව අනන්‍යතා නිසි සාකච්ඡාවට බඳුන් වීම, පුද්ගලයෙකුගේ ජීවිතයේ ප්‍රධාන සාධක ලෙස පිළිගැනීමට ලක් නොවීම, සක්‍රීය වශයෙන්ම නොසලකා හැරෙන බව හෝ ඉතාම සුවිශේෂයෙන් සඳහන් කරන්නේ නම් ඒවා ''දුරාචාර'' හෝ ''අවක්‍රියා'' ලෙස හංවඩු ගැසීම සිදු වන බවයි. මේ සම්බන්ධයෙන් ඕනෑ තරම් සාක්ෂි හා පර්යේෂණ පවතින නමුදු එකී ලේඛන කිසිවක් මගින් ශ්‍රී ලංකාවේ විවිධ ලිංගික දිශානති සහ/හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතා/ප්‍රකාශන පැවතීම පිළිගැනීමකට ලක් කර නොමැත.

සමාජයෙන් බැහැර කිරීමට ලක් කර ඇති පිරිස් අන්තර්ග්‍රාහී කිරීම වනාහි අඛණ්ඩ ප්‍රයත්න ඔස්සේ ළඟා කර ගත හැකි සංකීර්ණ ක්‍රියාවලියකි. අධ්‍යාපන සහ රැකියා අංශ තුළ LGBTIQ පුද්ගලයන්ට අදාළ ගැටළු ආමන්ත්‍රණය කිරීම මෙන්ම ඔවුන්ව වෙනස් කොට සැලකීමට ලක් කිරීම අවම කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකාවට ඇතැම් ධනාත්මක සහ අන්තර්ග්‍රාහී ප්‍රතිපත්තිමය වෙනස්කම් සිදු කළ හැකි අතර එහි දීර්ඝ කාලීන ප්‍රතිඵලයක් වශයෙන් සමස්ථ ආර්ථික සංවර්ධනය කෙරෙහිද මහඟු දායකත්වයක් ලැබෙනු ඇත. රාජ්‍ය ප්‍රතිපත්ති රැසකම අන්තර්ග්‍රාහීභාවය සහ/හෝ අන්තර්ග්‍රාහී සංවර්ධනය පිළිබඳව සඳහන් වන නමුදු LGBTIQ ජනතාව සෑම ක්ෂේත්‍රයකදීම අන්තර්ග්‍රහණය කර ගැනීමෙන් තොරව එකී අරමුණු සාක්ෂාත් කරගත නොහැක.

### රට තුළින් හමු වන සුභවාදී සංවර්ධනයන්

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ නවක වධය, අවමානයට ලක් කිරීම, හිංසනය සහ වෙනස්කොට සැලකීම වැළැක්වීමේ 2018 ප්‍රතිපත්ති ලිංගික දිශානතියද වෙනස් කොට සැලකීමට හේතු වන එක් පසුබිමක් ලෙස අන්තර්ගත කර ඇත. එම කාරණය පැහැදිලිව ආමන්ත්‍රණය කෙරෙන එවැනි ප්‍රතිපත්ති සෑම විශ්වවිද්‍යාලයක් සතුවම පැවතිය යුතු වේ.

ජාතික ළමා රක්ෂක අධිකාරිය විසින් සකස් කරන ලද 'ළමා සුරැකුම් සේවා ලබා දීම ආශ්‍රිත රැකියා සඳහා වූ පොදු ළමා සුරැකුම් පාඨමාලාව පිළිබඳව වන පුහුණුකරුවන්ට අදාළ මාර්ගෝපදේශය මගින් (2019) නැගී එන ලිංගික අනන්‍යතා (ලිංගික හා ස්ත්‍රී/පුරුෂ සමාජභාව දිශානති සංවර්ධනය) ආශ්‍රිත විවිධත්වය නව යෞවනයන් හට ඉගැන්වීම කෙරෙහි වැදගත්කම ලබා දෙන ලෙස පුහුණුකරුවන් හට උපදෙස් ලබා දේ. එමෙන්ම, නැගී එන ලිංගික හා ස්ත්‍රී/පුරුෂ සමාජභාවය ආශ්‍රිත විවිධතා විදහා දක්වනු පිණිස *'Genderbread Person'* යොදා ගන්නා ලෙසද එමගින් යෝජනා කෙරේ.

ඉහත කී ප්‍රතිපත්ති, ලේඛන හා ක්‍රම යාන්ත්‍රණ ආශ්‍රිතව දැකිය හැකි ගැටළු ආමන්ත්‍රණය කිරීම සඳහා අසල්වැසි රටවල් විසින් දියත් කර ඇති ක්‍රියාමාර්ගද සැලකිල්ලට ගනිමින් මෙම ප්‍රතිපත්ති සමාලෝචනයෙන් පහත නිර්දේශ යෝජනා කෙරේ:

### වෙනස් කොට සැලකීමට ලැබෙන මගපෙන්වීම් සහ/හෝ තොරතුරු පාසල් විෂය මාලාවෙන් ඉවත් කිරීම

අධ්‍යාපනයට අදාළ විවිධ ජාතික ලේඛන සමාලෝචනය කිරීමේදී පැහැදිලිව ගම්‍ය වූ කරුණක් වූයේ එකී ලේඛන/මාර්ගෝපදේශවල තවමත් වෙනස් කොට සැලකීමට පොළඹවන තොරතුරු ඇතුළත් වන බවයි. එමෙන්ම, ලිංගික දිශානතිය සහ/හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාව/ප්‍රකාශනය, ලිංගිකත්වය ආදී කාරණා ලිංගික අධ්‍යාපනයට අන්තර්ගත නොවේ. මෙම ලේඛන ස්වභාවය අතින්ම ඒකමානීය වන අතරම සමරිසි හැඟීම් දුරාචාර සහ සෞඛ්‍යයට අහිතකර කාරණා ලෙස සාවද්‍ය ලෙස හංවඩු ගැසීම සිදු වී තිබේ. මේ නිසා, එකී විධිවිධාන සහ මාර්ගෝපදේශ වඩා අන්තර්ග්‍රාහී වන පරිදි සංශෝධනය කළ යුතු වේ.

### අවමානයට ලක් කිරීම් වැළැක්වීමේ සහ/හෝ වෙනස් කොට සැලකීම ශුන්‍යකරණය කෙරෙන ප්‍රතිපත්ති පාසල් මට්ටමින් ක්‍රියාත්මක කිරීම

එච්අයිවී (HIV) ආසාදනයට ලක් වූ හෝ එවැන්නන් සමග ජීවත් වන දරුවන් හට අධ්‍යාපනය සඳහා පූර්ණ අයිතියක් ඇති බවටත් ඔවුන් වෙනස් කොට සැලකීමට කිසිදු ඉඩක් නොමැති බවටත් ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2016 වසරේදී තීන්දු කරන ලදි. කෙසේ වෙතත්, කෙනෙකුගේ එච්අයිවී තත්ත්වයෙන් බැහැරව බැලූ කල  කිසියම් දරුවෙකු සාම්ප්‍රදායිකව පිළිගැනී ඇති බාහිර පෙනීමේ ස්වභාවයන් (සාමාන්‍ය උසට වඩා කෙටි වීම, සාමන්‍ය බරට වඩා අඩු බරින් යුතු වීම හෝ උපැස් යුවළක් පැළඳීම වැනි), සම්ප්‍රදායික සාමාජීය ප්‍රමිතීන්ට අනුගත නොවීම (එනම්, විෂමලිංගිකභාවය සම්මත හෝ පිළිගත් ලිංගික දිශානතිය වන්නේය යන පිළිගැනීම) යන මේ සියලුම කාරණා ඔවුන් අවමානයට ලක් කිරීමේ වින්දිතයන් බවට පත් කිරීමට හේතු විය හැකි සාධක වෙයි. මේ නිසා, දරුවෙකුගේ ලිංගික දිශානතිය සහ/හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාව අනන්‍යතාව/ප්‍රකාශනය පදනම් කරගෙන සිදු කෙරෙන අවමානයට ලක් කිරීම් හෝ වෙනස් කොට සැලකීම්වලට එරෙහි පාසල් ප්‍රතිපත්ති පිහිටුවා තිබීම වැදගත් වේ. නිදසුනක් ලෙසඃ කොළඹ පිහිටි ජාත්‍යන්තර පාසලක් වන බ්‍රිටිෂ් ස්කූල් විසින් සිය පාසලේ අවමානයට ලක් කිරීම් වැළැක්වීමේ ප්‍රතිපත්තියට කිසියම් පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් ඉලක්ක කරගෙන ලිංගික ගම්‍යාර්ථ දනවන, සමරිසි භීතිකාව පාදක හෝ විදේශිකයින් සහ තම වර්ගයාගෙන් පරිබාහිර පුද්ගලයන් නුරුස්නා අදහස් ගම්‍ය කෙරෙන භාෂා භාවිතයන් වැළැක්වීමද ඇතුළත් කර තිබේ.

### ගුරුවරුන්ගේ සහ අධ්‍යාපනඥයන්ගේ සංවේදීතාව ඉහළ නැංවීම

ලිංගික අධ්‍යාපනය, ලිංගිකත්වය, විවිධ ලිංගික දිශානති සහ/හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතා/ප්‍රකාශන ආදී කාරණා පිළිබඳව සාකච්ඡා කිරීමට ගුරුවරුන් මැළිකමක් දක්වන බව අධ්‍යයන මගින් පෙන්නුම් කෙරේ. තමන් හට නිවැරදි තොරතුරු සිසුන් අතර බෙදා හැරීමට හැකි වනු පිණිස ගුරුවරුන් මෙකී කාරණා සම්බන්ධ සංවේදීතාවක් සතු විය යුතු වේ.

### පාසල් මට්ටමින් මානසික සෞඛ්‍ය උපදේශකයන් ඇගයීමට ලක් කිරීම

පාසල් මට්ටමේ මානසික සෞඛ්‍ය උපදේශකයන් ලිංගික දිශානතිය සහ/හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාව/ප්‍රකාශනය ආශ්‍රිත ගැටළු සම්බන්ධ අවබෝධයකින් සහ සංවේදීතාවකින් පසු වන්නේද යන්න හඳුනා ගනු පිණිස ඔවුන්ව නිසි ඇගයීමකට නොහොත් තක්සේරුවකට ලක් කළ යුතුය. එසේ නොවුණහොත්, ස්වකීය ලිංගිකත්වය හෝ ඒ හා සබැඳි වෙනත් ප්‍රශ්න සහිත සිසුන් වෙත අවශ්‍ය සහාය නොලැබී යාමට ඉඩ ඇත.

### සමීක්ෂණ ප්‍රතිඵල

සිසුන් නව දෙනෙකුගෙන් දෙනෙකුම අනිවාර්ය නව අවුරුදු අධ්‍යයන චක්‍රය සම්පූර්ණ කිරීමට පෙර පාසල් හැර යන තත්ත්වයක් ඇති අතර පාසල් නොපැමිණීම ඉහළ මට්ටමකින් පවතී. මේ නිසා, පාසල් හැර යාමට බලපාන හේතු සම්බන්ධයෙන් වැඩි වැඩියෙන් පර්යේෂණ අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජාතික අධ්‍යාපන ආයතනය විසින් සිදු කළ යුතු වේ. ලිංගික දිශානතිය සහ/හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාව/ප්‍රකාශනය පදනම් කරගෙන සිදු වන අවමන් කිරීම් සහ/හෝ හිංසනයන් පාසල් හැර යාම පසුපස හේතුවක් ලෙස තිබේද යන්න සොයා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රමාණාත්මක දත්ත/සාක්ෂි ලබා ගැනීමට එයින් පිටුබලයක් ලැබෙනු ඇත.

**නවක වධ පනත තුළ නවක වධය සම්බන්ධයෙන් වඩා සුවිශේෂී සහ අන්තර්ග්‍රාහී නිර්වචනයක් ලබා දීම**

අඩන්තේට්ටම් කිරීම සහ ලිංගික හිංසනයට පාත්‍ර කිරීමද නවක වධය නිසා සිදු විය හැක. මේ නිසා, නවක වධයට අදාළ ක්‍රියා මෙන්ම කෙනෙකුගේ ලිංගික දිශානතිය සහ/හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාව/ප්‍රකාශනය පාදක කරගෙන සිදු කරනසු ලැබෙන හිංසනයන්/අවමානයට ලක් කිරීමද ඇතුළත් වන නිර්වචනයක් ඊට ඇතුළත් විය යුතුය.

**අධ්‍යාපන ආයතන සහ සේවා ස්ථාන සඳහා විවිධත්වය හා අන්තර්ග්‍රාහීභාවය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම**

රාජ්‍ය සහ පෞද්ගලික දෙඅංශයේම අධ්‍යාපන හා සේවා යෝජක ආයතන විසින් එකී ආයතන තුළ විවිධත්වය හා අන්තර්ග්‍රාහීත්වය ඉලක්ක කරගත් පුහුණු වැඩසටහන් පැවැත්විය යුතු අතර විවිධ ලිංගික දිශානති සහ/හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතා/ප්‍රකාශන, ලිංගිකත්වයට අදාළ විවිධ පැතිකඩ, අන්තර්ග්‍රාහීත්වයේ වැදගත්කම සහ විවිධත්වයට ගරු කිරීම ආදී කාරණා සම්බන්ධයෙන් සේවකයන්ගේ දැනුවත්භාවය ඉහළ නැංවීමට එය හේතු වනු ඇත. ඇතැම් පුද්ගලයන් අපහසුවට ලක් කෙරෙන මාතෘකා සමග වඩා සමීපව කටයුතු කිරීමට, සමාජමය තහංචි බිඳ දැමීමට සහ සුරක්ෂිත ඉගෙනුම් හා සේවා පරිසරයක් බිහි කිරීමට එකී වැඩසටහන් හේතු වේ.

**සේවා ස්ථාන ආශ්‍රිත අන්තර්ග්‍රාහීත්වයට අදාළ ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම සහ සංශෝධනය කිරීම**

සේවා ස්ථානවලදී සිදු කෙරෙන වෙනස් කොට සැලකීම් සම්බන්ධයෙන් EQUAL GROUND විසින් සිදු කරන ලද පර්යේෂණ අධ්‍යයනයකදී හෙළි වූයේ ඒ සඳහා සම්මුඛ සාකච්ඡාවන්ට බඳුන් කරන ලද ආයතන සියල්ලම අතරින් 56% ක් තමන් සේවය කරන ආයතනවල සම්ප්‍රදායික සේවකයන් වෙනුවෙන් කිසිදු අයුරක අන්තර්ග්‍රාහීභාවයකින් යුතු ප්‍රතිපත්තියක් නොමැති බව වූ අතර කවර හෝ ස්ත්‍රී/පුරුෂ සමාජභාවය හා සබැඳි ප්‍රතිපත්තියක් තමන් සතුව නොමැති බව 53% ක ගේ මතය විය. මේ නිසා, පවතින ප්‍රතිපත්ති සංශෝධනය කොට LGBTIQ සේවකයන්ගේ අයිතිවාසිකම්ද ආරක්ෂා කිරීමට හැකි වන පරිදි ඒවා අන්තර්ග්‍රාහී ප්‍රතිපත්ති බවට පත් කිරීමේ අවශ්‍යතාවක් පවතී.

**C190 වෙත අත්සන් තැබීම**

2019 ප්‍රචණ්ඩත්වය සහ හිංසනය පිළිබඳ සම්මුතිය (අංක 190) යනු සේවා ස්ථානවල සිදු කෙරෙන ප්‍රචණ්ඩත්වය හා හිංසනයට තිත තැබීම ඉලක්ක කරගත් පළමු ජාත්‍යන්තර සම්මුතිය වේ. ප්‍රචණ්ඩත්වයෙන් සහ හිංසනයෙන් තොර සේවා පරිසරයක් ලබා ගැනීමට සෑම අයෙකුටම අයිතිය ඇති බව එමගින් පිළිගැනේ. අවාසනාවකට මෙන් එයට අත්සන් තබා ඇත්තේ රටවල් දෙකක් විසින් පමණක් වන අතර ශ්‍රී ලංකාව ඊට ඇතුළත් නොවේ. රජය මෙම සම්මුතියට අත්සන් තැබුවහොත්, මෙම පුළුල් ගැටළුව සමනය කර ගැනීම උදෙසා සේවා ස්ථානයේදී සිදු වන ලිංගික හිංසනය වළක්වා ගැනීම සඳහා නීති ක්‍රියාත්මක කිරීම දිරිගැන්වීමට සහ පහසු කිරීමට ඉන් සහායක් ලැබෙනු ඇත.

**සේවා ස්ථානවල ලිංගික හිංසනයට අදාළ විධිවිධාන කම්කරු නීති සංග්‍රහයට ඇතුළක් කිරීම**

දැනට පවතින නෛතික ක්‍රමවේදයට අනුව ලිංගික හිංසනය සම්බන්ධ වෙනම විධිවිධාන පවතින්නේ දණ්ඩ නීති සංග්‍රහයේ පමණක් බැවින් එකී වින්දිතයන් හට අපරාධ නීති ක්‍රමවේදය අනුගමනය කරන්නට සිදු වේ. කම්කරු නීති සංග්‍රහය මගින් ආවරණය කෙරෙන ගැටළු සම්බන්ධයෙන් කටයුතු කරන්නේ කම්කරු උසාවි විසින් වන අතර මේ නිසා එම ක්‍රියාවලිය පීඩාවට පත් වූ පුද්ගලයා හට සාපේක්ෂ වශයෙන් පහසු කෙරේ. මේ නිසා, සේවා ස්ථානවලදී සිදු වන ලිංගික හිංසනය යන ගැටළුවද කම්කරු නීති සංග්‍රහයට ඇතුළත් කිරීමට කාලය එළැඹ තිබේ.

## Works Cited


Anti-Bullying school policy, The British School in Colombo, https://www.britishschool.lk/userfiles/bscmvc/BSC%20002%20Anti-Bullying%20Policy.pdf

Brown, K (2017), Mapping LGBT in Colombo, Kandy and Nuwara Eliya, EQUAL GROUND, https://www.equal-ground.org/wp-content/uploads/Mapping-LGBT-in-Colombo-Kandy-Matara-and-Nuwara-Eliya.pdf

Dissanayake D, Weeratunge W, Gaspe G, Gamage A. Peer pressure and bullying among school going adolescents in the district of Kandy. J Coll Community Physicians Sri Lanka 2012. file:///C:/Users/HP/Downloads/4929-17514-1-PB.pdf

CARE (2013), Broadening gender: Why masculinities matter – attitudes, practices and gender-based violence, https://www.ugc.ac.lk/downloads/publications/SGVB.pdf

Counterpoint. (2018). Preventing Sexual and Gender Based Violence at Universities, available at: http://counterpoint.lk/preventing-sexual-and-gender-based-violence-atuniversities/

Chowdhury, S.A. (2021), A study on workplace discrimination: Challenges faced by LGBTIQ employees and the perspectives of employers in Sri Lanka, EQUAL GROUND, Sri Lanka.

Code of Conduct and Guidelines to Prevent and Address Sexual Harassment in Workplaces, https://www.ilo.org/wcmsp5/groups/public/---asia/---ro-bangkok/---ilo-colombo/documents/publication/wcms_525537.pdf

Concluding Observations of Convention on the Child Rights, Sri Lanka (2010), http://34.196.27.239/storage/app/media/concluding-observation-34.pdf

Decent work Country Programme, Sri Lanka (2018-2022), wcms_632743.pdf (ilo.org)

(EQUAL GROUND (2021), Mapping LGBTIQ Identities in Sri Lanka, https://www.equal-ground.org/wp-content/uploads/Report_EG-edited.pdf

Gunasekara SD, Young SM, Guruge GND (2021). Identifying Determinants of Bullying and Deciding on Measures through Engaging Adolescents in a Rural School in Sri Lanka. Asian Pac. J. Health Sci., 2021;8(1):69-75.

Health and Physical Education Teachers' Guide (2016) for Grade 7, https://nie.lk/pdffiles/tg/e7tim155.pdf

Health and Physical Education Teachers' Guide (2016) for Grade 8, http://www.nie.lk/pdffiles/tg/Health_TG_Gr_8_English_new.pdf

Health and Physical Education Teachers' Guide (2016) for Grade 10, https://nie.lk/pdffiles/tg/e10tim116.pdf

Huizhong (2017), India busts taboo with new Sex Ed Manual, https://edition.cnn.com/2017/02/23/asia/india-sex-education/index.html

Maharashtra sociology textbook includes single-parent, same-sex families, https://www.hindustantimes.com/india-news/maharashtra-sociology-textbook-includes-single-parent-same-sex-families/story-Thx65uxahpMTl4crKsJgKI.html

National Child Protection Authority (2019), 'Trainers Guide on General Child Care Course for Careers in Child Care Giving', https://www.childprotection.gov.lk/images/pdfs/acts-guidelines/2019%20%20Trainers%20Guide%20(%20General%20Child%20Care%20Course%20_%20NVQ%20Level%204)%20-%20English.pdf

National Centre for Partnership & Performance (NCPP) and the Equality Authority: New models of high-

performance work systems. The business case for strategic HRM, partnership and diversity and equality systems (Dublin, 2008).

National Human Resources and Employment Policy (NHREP), https://www.ilo.org/wcmsp5/groups/public/---asia/---ro-bangkok/---ilo colombo/documents/genericdocument/wcms_632743.pdf

Pathirana, D (2016), International Journal of Advanced Research (2016), Volume 4, Issue 6, 30-Preventing Sexual and Gender-Based Violence (SGBV), Strategies for Universities (2015), CARE International, Sri Lanka, https://www.ugc.ac.lk/downloads/publications/SGVB.pdf

Public Health Inspector (PHI) Manual, https://medicine.kln.ac.lk/depts/publichealth/Fixed_Learning/PHI%20manual/PHI%20New%20Documents%20Including%20full%20PHI%20Manual%20$%20Office%20Documents/PHI%20Manual%20Full/11%20Chapter%209%20-%20SCHOOL%20HEALTH%20PROGRAMME%20-(285-294).pdf

Ragging, Bullying, Harassment and Discrimination Prevention Policy 2018 of Wayamba University of Sri Lanka, https://eugc.ac.lk/cgee/downloads/policies/WUSL-Prevention-of-Ragging.pdf

Re-imagining Education in Sri Lanka (2020), Presidential Task Force on Sri Lanka's Education Affairs, Summary Report.

Rules and Regulations for Preventing and Prohibition of Ragging, India, http://nitm.ac.in/uploads/33575b4f0170d73f80586a96fff94332.pdf

Sexual and Gender Based Violence (SGBV) National Action Plan (2016-2020), http://gbvforum.lk/r-library/document/SGBV%20National%20Action%20Plan.pdf

SAATHII (2021), Media release, https://docs.google.com/document/d/1JSwXmjwdLE0-UHnliDRmj6k6ijPfikb6/edit

The Indian Express (2019), https://indianexpress.com/article/cities/delhi/delhi-transgender-sensitisation-workshops-schools-trans-inclusion-5825942/

Sri Lanka Supreme Court - Access to education of people living with HIV/AIDS, Right to Education Initiative (right-to-education.org)

The Industrial Disputes Act, http://www.labourdept.gov.lk/images/PDF_upload/chapter01/1_industrial_disputes_acti.pdf

The Ragging Act, https://eugc.ac.lk/rag/downloads/Act_No_20_EN.pdf

UNICEF Programme Report (2012-2016), Peacebuilding, Education and Advocacy in Conflict-Affected Context Programme, https://files.eric.ed.gov/fulltext/ED573879.pdf Also see: https://www.ft.dk/samling/20191/almdel/uru/bilag/28/2102721.pdf

United Nations Free & Equal, Bullying and Violence in Schools, https://www.unfe.org/wp-content/uploads/2017/05/Bullying-and-Violence-in-School.pdf

UNESCO (2017), School Violence and Bullying: Global status report. http://unesdoc.unesco.org/images/0024/002469/246970e.pdf. Also see: https://www.unicef.org/srilanka/media/2321/file/Bullying%20Study-ENGLISH.pdf

Vision 2025: A Country Enriched, http://extwprlegs1.fao.org/docs/pdf/srl179513.pdf

World Bank. 2013. Inclusion Matters: The Foundation for Shared Prosperity, New Frontiers of Social Policy; Washington, DC. World Bank, https://openknowledge.worldbank.org/handle/10986/16195.

**Supported by**

KALEIDOSCOPE
INTERNATIONAL TRUST

EQUAL GROUND

"Equality for all Sexual Orientations and Gender Identities: Human Rights for Everyone"

"සියලුම ලිංගික දිශානතීන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාව අනන්‍යතාවයන් ඇති මිනිසුන්ට සමානාත්මතාවය: සැමට මානව අයිතිවාසිකම්"

"அனைத்து பாலியல் நாட்டத்திற்கும் மற்றும் பாலினம் அடையாளங்கலுக்கும் ஒரே சமத்துவம்:எல்லேருக்கும் மனித உ்ரிமைகள"


Tel: +94-11- 4334277/ +94-11- 4334278 / +94-11- 4334279

www.equal-ground.org
EQUALGROUND
equalground.srilanka
equalground123
_equalground_
+94-11-2075414